සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය **ක්‍රිස්තියානි ධර්මය I** කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01 ''එම්මානුවෙල්'' යන නාමයේ අර්ථය වන්නේ,
(1) ගැලවුම්කාරයා යන්නයි. (2) දෙවියන්වහන්සේ අප සමගය යන්නයි.
(3) ආලේපලත් තැනැත්තා යන්නයි. (4) තෝරාගත් තැනැත්තා යන්නයි.

02 මෙහෙසුරු දිවැසිවරයා ලෙස හැඳින්වූ පුද්ගලයා වන්නේ,
(1) ස්නාවක ජෝහන්තුමා ය. (2) එළියා දිවැසිවරයා ය.
(3) මෝසෙස් තුමා ය. (4) යෙසායා දිවැසිවරයා ය.

03 චර්මච්ඡේදන පිළිවෙත මගින් ජුදෙව් ජනතාව ඇතුළුවූයේ,
(1) දේව රාජ්‍යයේ හිමිකරුවන් වීමට යි. (2) සදාතන ජීවනය ලබා ගැනීමට යි.
(3) දෙවියන්වහන්සේට සන්තක වීමටයි. (4) තෝරාගත් ජනතාවක් වීමටයි.

04 ජේසුස් වහන්සේගේ කාලයේ ආගමික දැනුම ලබාදීම සිදුකරනු ලැබුවේ.
(1) දේව මාළිගාවේදී ය. (2) සිනගෝගයේදී ය.
(3) එළිමහන් ස්ථානවලදී ය. (4) ජෙරුසලම් මන්ත්‍රණ සභාවේදී ය.

05 ජේසුස් වහන්සේ ''ආබ්‍රහම්ගේ දියණිය'' ලෙස හැඳින්වූයේ,
(1) පව්කාර ස්ත්‍රිය ය. (2) කුදු ස්ත්‍රිය ය.
(3) මග්දලායේ මරියාව ය. (4) මාර්තාව ය.

06 ''රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් වැඩක් නැත.'' මෙලෙස ජේසුතුමා පැවසුවේ,
(1) සාකෙවුස් කැඳවීමේදී ය. (2) මතෙව් කැඳවීමේදී ය.
(3) පේදුරු කැඳවීමේදී ය. (4) පාවුල් කැඳවීමේදී ය.

07 දේවදූතයන් හා පුණර්ජීවණය පිළිනොගත් ජන කණ්ඩායම වන්නේ,
(1) සද්දුසිවරු ය. (2) විනයධරයන් ය.
(3) පරිසිවරු ය. (4) එසීනවරු ය.

08 ඔබගේ මිතුරකු නීතිවිරෝධී කටයුත්තක් කිරීමට ඔබට ආරාධනා කළ හොත් ඔබ මෙනෙහි කළ යුතු වන්නේ,
(1) පරීක්ෂාවට නොපමුණුවා නපුරෙන් අප ගළවා ගත මැනව යන්නයි.
(2) මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා යන්නයි.
(3) මේ කුසලාන මාගෙන් පහකළ මැනව යන්නයි.
(4) පරීක්ෂාවට නොවැටෙන පිනිස යාච්ඤා කරන්න යන්නයි.

09 කුරුස ගසේදී ජේසුස්වහන්සේ පැවසූ අවසාන වදන වන්නේ,
(1) ඒළී ඒළී ළාමා සබක්තානි යන්නයි.
(2) පියාණෙනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාරදෙමි යන්නයි.
(3) සියල්ල නිමවිය යන්නයි.
(4) මොවුන් නොදැන කරන වරදට සමාවුව මැනව යන්නයි.

10 පේදුරු ක්‍රිස්තුන් වහන්සේ ගැන මනා අවබෝධයකින් සිටි බවට ඔහු කළ ප්‍රකාශය වන්නේ,

(1) මා වෙතින් ඉවත් වුව මැනව මම පව්කාර මනුෂ්‍යයෙකි යන්න ය.

(2) ස්වාමීනි ඔබ සමඟ හිරේ යාමට හා මරණයට වුවද සූදානම් යන්න ය.

(3) මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නා සේක යන්න ය.

(4) ඔබ දෙවියන්වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ යන්න ය.

11 පෞද්ගලික අවශ්‍යතා ගැන කරදර වීම නිශ්ඵල බව ඉගැන්වීමට ජේසුස්වහන්සේ යොදාගත් සංකේතය වන්නේ,

(1) කෙතේ මානෙල් හා කපුටන් ය. (2) කෙතේ මානෙල් හා ආහාර ය.

(3) කෙතේ මානෙල් හා අහසේ පක්ෂීන් ය. (4) කෙතේ මානෙල් හා ඇඳුම් පැළඳුම් ය.

12 දේව රාජ්‍යයට ඇතුළුවීමට තිබිය යුතු අනිවාර්ය සාධකයක් වන්නේ,

(1) ඇදහිල්ල යි. (2) සේවය කිරීම යි.

(3) මනස්ථාපනය යි. (4) ප්‍රේමය යි.

13 ජේසුස් වහන්සේගේ සේවක නායකත්වය ආදර්ශයෙන් පෙන්වූ සුවිශේෂීම අවස්ථා දෙක වන්නේ,

(1) ගෝලයින්ගේ පාද සේදීම හා සාකෙවුන්ගේ නිවසට යාමයි.

(2) ගෝලයින්ගේ පාද සේදීම හා පවුකාර ස්ත්‍රියට සමාව දීම ය.

(3) ගෝලයින්ගේ පාද සේදීම හා පවුකරුවන් සමග ආහාර ගැනීම.

(4) ගෝලයින්ගේ පාද සේදීම හා කුරුසියේදී දිවි පිදීම යි.

14 ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා යොදා ගත් ප්‍රබල ම ක්‍රමවේදය වන්නේ,

(1) දේශනාකිරීම ය. (2) උපමා භාවිතය යි.

(3) ජීවිතාදර්ශය යි. (4) ගෙයින්ගෙට ගොස් ඉගැන්වීම යි.

15 පරිසිවරයාගේ නිවසේ භෝජන සංග්‍රහයට සහභාගී වූ අවස්ථාවේ ජේසුස් වහන්සේ පැවසූ උපමා කථාව වන්නේ,

(1) ධනපතියා හා ලාසරුන්ගේ උපමා කථාව යි.

(2) මහා මංගල භෝජනය ගැන උපමාව යි.

(3) පරිසිවරයා හා අයකැමියා ගැන උපමාව යි.

(4) අකීකරු පුතාගේ උපමා කථාව යි.

16 ධර්මිෂ්ඨකම නොතකා ක්‍රියා කරන ජුදෙව්වන් අවදි කිරීමට ජේසුස් වහන්සේ සිදුකල සංකේතාත්මක ක්‍රියාව වන්නේ,

(1) ගෙත්සෙමනේ යාච්ඤාවයි. (2) දේව මාළිගාව පවිත්‍ර කිරීමයි.

(3) රාජ තේජසින් ජෙරුසලමට යාමයි. (4) අන්තිම රාත්‍රී භෝජනයයි.

17 අන්වෙසක් වීමේ සිදුවීමට ජේසුතුමා හා සම්බන්ධ වූ ශ්‍රාවකයින් තිදෙනා වන්නේ,

(1) පේදුරු, ජාකොබ්, ජොහන් (2) පේදුරු, ඇන්ඩෘ, ජොහන්

(3) පේදුරු, ජාකොබ්, මතෙව් (4) පේදුරු, ජොහාන්, මතෙව්

18 ''මුළු ඊශ්‍රායෙල් ජනතාව අතරවත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දැක නැත.'' මෙලෙස ජේසුස් වහන්සේ පැවසුවේ,

(1) ජෙරිකෝවේ අන්ධයාට (2) අංශභාග රෝගියාට

(3) කපර්ණවුමේ ශතාධිපතියාට (4) කුදු ස්ත්‍රියට

19 පහත සඳහන් පුද්ගලයින් අතරින්,

A - ස්ත්‍රීන් ය.

B - එම්මාවුස් බලාගිය ගෝලයන් ය.

C - ජේසුතුමාගේ ශ්‍රාවකයින් ය.

D - කිරෙනියේ සීමොන් ය.

ජේසුස් වහන්සේගේ උත්ථානයට සාක්ෂි දැරූ පුද්ගලයින් අඩංගු පිළිතුර වන්නේ,

(1) A, C, D ය. (2) A, B, C ය. (3) B, C, D ය. (4) A, C, D ය.

20 කිතුනු අපට ධෛර්ය ශක්තිය හා සැනසීම ලබාදෙන ප්‍රධාන මාර්ගය වන්නේ,

(1) දේවස්ථානයට යෑමයි. (2) පූජකතුමාට පව් කියා සිටීමයි.

(3) දහම් පාසලට යාමයි. (4) යාච්ඤා කිරීම යි.

21 ලාදුරු රෝගීන් දසදෙනා සුව කිරීමේ සිද්ධියෙන් අපට ලබා දෙන පණිවිඩය වන්නේ,

(1) දේව රාජ්‍යය වෙනුවෙන් කැපවිය යුතු බවයි.

(2) අන් අයට ආලෝකය පැතිරවිය යුතු බවයි.

(3) දෙවිඳුන්ට ස්තුති වන්ත විය යුතු බවයි.

(4) ජාති කුල භේද නොසලකා ජීවත් විය යුතු බවයි.

22 70 දෙනා පිටත්කර හැරීමේදී ජේසුස්වහන්සේ පැවරූ කාර්යයක් නොවන්නේ,

(1) රෝගීන් සුව කරන ලෙස ය.

(2) නිවෙස්වලට සාමය පතන ලෙස ය.

(3) සේවකයන් ඉල්ලා යාච්ඤා කරන ලෙස ය.

(4) අන්‍ය ජාතිකයන් බැහැ දකින ලෙස ය.

23 ජේසුස්වහන්සේ සිය ජීවිතයේ අවසාන දින කිහිපයේ යාච්ඤාව පෙරදැරි කරගෙන දෙවිඳුන්ගෙන් ලබාගත්තේ,

(1) ඉවසීම හා ශක්තියයි. (2) කරුණාව හා බලාපොරොත්තුවයි.

(3) ශක්තිය හා බලයයි. (4) ශක්තිය හා බලාපොරොත්තුවයි.

24 පාවුල්තුමා විසින් රචිත ''ප්‍රේම පාරමිතාව'' සඳහන්ව ඇති බයිබල් ග්‍රන්ථය වන්නේ,

(1) එපීස පොත ය. (2) I කොරෙන්ති පොත ය.

(3) II කොරෙන්ති පොත ය. (4) හෙබ්‍රෙව් පොත ය.

25 වර්තමානයේ සභා එකමුතුව උදෙසා කටයුතු කරන සංවිධානයක් නොවන්නේ,

(1) තරුණ ක්‍රිස්තියානි සංගමය ය. (2) ක්‍රිස්තියානි කම්කරු සහෝදරත්වය ය.

(3) ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය ය. (4) යුනෙස්කෝ ආයතනය ය.

26 සාම රාජ්‍යයේ මූලික අංග දෙක වන්නේ,

(1) යුක්තිය හා සාධාරණත්වයයි. (2) ප්‍රේමය හා සාමයයි.

(3) යුක්තිය හා ප්‍රේමයයි. (4) සාමය හා සාධාරණත්වයයි.

27 එඬේර සංකල්පය අර්ථවත් ලෙස දක්වා ඇති බයිබලීය ග්‍රන්ථය වන්නේ,

(1) එසකියෙල් පොත ය. (2) ගීතාවලිය පොත ය.

(3) ජෙරමියා පොත ය. (4) හිතෝපදේශ පොත ය.

28 පේදුරුතුමා හා ජොහන්තුමා විසින් සිදුකරන ලද ප්‍රාතිහාර්ය වන්නේ,

(1) අංශභාග රෝගියා සුව කිරීමයි.

(2) ලාදුරු රෝගියෙකු සුව කිරීමයි.

(3) සුදර්ශන දොරටුව අසළ සිටි කොරෙකු සුව කිරීමයි.

(4) බෙතෙස්දා පොකුණ අසළ සිටි කොරා සුව කිරීමයි.

29 මුල් සභාවේ ධර්මදූත මෙහෙවර දියත් කළ ප්‍රථමයා වන්නේ,

(1) පාවුල්තුමා ය. (2) ජොහන්තුමා ය.

(3) ස්තේපන් තුමා ය. (4) පේදුරුතුමා ය.

30 මානසිකව හා ආත්මිකව පීඩා විඳි ජනතාවට ජේසුස් වහන්සේ සහන සැලසූ අවස්ථා දෙකක් වන්නේ,

(1) යක්ෂයන් දුරු කිරීම හා මළවුන් නැගිටුවීම යි.

(2) ළදරුවන්ට ආශිර්වාද කිරීම හා යක්ෂ ආත්මයක් දුරුකිරීම යි.

(3) සමාරිය ස්ත්‍රියට කරුණාව දැක්වීම හා මළවුන් නැගිටවීම යි.

(4) අංශභාග රෝගියා සුව කිරීම හා ලාදුරු රෝගියා සුව කිරීම යි.

31 ''අත්වලින් සෑදූ දෙවිවරු දෙවිවරු නොවේ ය.''යන පාවුල්තුමාගේ ඉගැන්වීම නිසා පහර වැදුනේ,

(1) අකිලා හා ප්‍රිස්කිලාගේ කූඩාරම් කර්මාන්තයට ය.

(2) අරියෝපග ශාලාවේ දාර්ශනිකයන්ට ය.

(3) අර්තේමිස් දේවාලයේ රිදී රූප ව්‍යාපාරයට ය.

(4) බොරු දිවැසිවර බාර් ජේසුස්ට ය.

32 එපීසය මුලකරගෙන පාවුල්තුමා ගමන් ගත් ධර්මදූත චාරිකාව වන්නේ,

(1) පළමු ගමන ය. (2) දෙවන ගමන ය.

(3) තුන්වැනි ගමන ය. (4) රෝම ගමන ය.

33 ''යුක්තිය ගලාබසින දියදහරක් මෙන් ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන්''ද විය යුතු බව පැවසූ දිවැසිවරයා,

(1) ජෙරමියා ය. (2) ආමොස් ය.

(3) යෙසායා ය. (4) මීකා ය.

34 සර්පයෙකු පාවුල්ගේ අතේ එල්ලුන ද අනතුරක් සිදු නොවීම තුළින් සාක්ෂි දැරුවේ,

(1) එපීසයේදී ය. (2) ඇතන්ස්හිදී ය.

(3) රෝමයේදී ය. (4) මෝල්ටාවේදී ය.

35 ක්‍රිස්තුන් වහන්සේ හා සම්බන්ධවීමට අප තුල ඇති පිපාසාව අපේ ජීවිත ආකල්ප වෙනස්වීම කෙරෙහි බලපාන බව පවසන සිදුවීම වන්නේ,

(1) නිකදේමුස්ගේ සිද්ධිය ය. (2) සමාරි ස්ත්‍රියගේ සිදුවීම ය.

(3) මතෙව්ගේ සිද්ධිය ය. (4) සාකෙවුස්ගේ සිදුවීම ය.

36 දෙවියන්වහන්සේ විසින් මවනුලැබූ මිනිසා හා ස්ත්‍රියගෙන් දෙවිඳුන් බලාපොරොත්තු වන්නේ,

(1) ප්‍රේමයෙන් යුතුව ජීවත්වීම ය. (2) තමා ගෞරව ලබමින් ජීවත්වීම ය.

(3) අන් අය පාලනය කරමින් ජීවත්වීම ය. (4) උතුම් මැවිල්ල ගැන උදම් අනමින් ජීවත්වීම ය.

37 සමාජීය කටයුතුවලදී කිතුනු නොකිතුනු අයට එක්වී කටයුතු කිරීමට හැකිවීම තුළින් පෙන්නුම් කෙරෙන සමාජ ධර්මතාවයක් වන්නේ,

(1) කිතුනු අප පමණක් මූලික වෙමින් ජීවත් වීම ය.

(2) සහජීවනයෙන් ජීවත්වීම ය.

(3) අවශ්‍ය අවස්ථාවලදී පමණක් සහය වී ජීවත් වීම ය.

(4) තම අරමුණු පමණක් මුල්කරගෙන ජීවත්වීම ය.

38 දේව රාජ්‍යය තුළ සැබෑ පොහොසත්කම යනු,

(1) දේපල ඉඩකඩම්වලින් සන්නද්ධ වීම ය.

(2) පොළොවේ වස්තු රැස්කිරීම ය.

(3) අන් අයව ආර්ථික අතින් පොහොසත් කිරීම ය.

(4) අයහපත් ගුණාංගවලින් හිස්වීම ය.

39 තමා කාලකන්නියෙක් බව පවසා සිටි දිවැසිවරයා වන්නේ,

(1) ජෙරමියා ය. (2) ආමොස් ය. (3) යෙසායා ය. (4) මීකා ය.

40 සමාජයේ ජීවත්වූ ධනපතීන්ගේ භාර්යාවන්ව ආමොස් හඳුන්වන්නේ,

(1) එල නැති අත්තික්කා ගසවලට ය. (2) තරබාරු එළදෙනුන්ට ය.

(3) සරුසාර මිදිවතුවලට ය. (4) නිසරු එළදෙනුන්ට ය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **ක්‍රිස්තියානි ධර්මය II** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය අනිවාර්ය ය. තවත් ප්‍රශ්න 4ක් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(01) සියළුම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) කිතු උපත සම්බන්ධයෙන් දේව සැලැස්මට අවනත වූවන් දෙදෙනෙක් නම් කරන්න.

(ii) ජේසුස් වහන්සේගේ බෞතිස්මය පිළිබඳ සඳහන් කරන සුභාරංචි පොත් දෙකක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේ අයකැමියන් හා පව්කරුවන් පිළිගෙන ඔවුන් සමග කන බොන බවට චෝදනා එල්ල කළ කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(iv) රන් අණ ලියා දක්වන්න.

(v) දර්ශන මගින් දිවැසිවර සේවයට කැඳවනු ලැබූ දිවැසිවරුන් දෙදෙනෙක් නම් කරන්න.

(vi) පුරාණ ගිවිසුමේ <u>මිදිවත්ත</u> පිළිබඳව ඉගැන්වූ දිවැසිවරයා කව්ද?

''මිදිවත්ත'' සමාන කරන්නේ කුමකට ද?

(vii) ආබ්‍රහම්තුමා ලද ආශිර්වාද තුළින් මිහිමත සියළුදෙනා ආසිරි ලබාගත්තේය. මේ සඳහා ආබ්‍රහම්තුමා තුළ කැපී පෙනුන ලක්‍ෂණ දෙකක් ලියන්න.

(viii) සදාතන ජීවිතය අත්කර ගැනීමට අවශ්‍ය කරුණු දෙකක් ලියන්න.

(ix) අප ආර්ථික වශයෙන් රැස්කරන වස්තු විනාශවන ක්‍රම දෙකක් ලියන්න.

(x) ''සතුට හා සොම්නස ඔබට ඇතිවේ. බොහෝදෙනා ඔහුගේ උපත නිමිත්තෙන් ප්‍රීතිවන්නා හ.'' මෙය ප්‍රකාශ කලේ කවුද? මෙහි <u>ඔහු</u> යනුවෙන් හඳුන්වන්නේ කවුරුන්ව ද? (2 x 10 = 20)

(02) (i) දේව සැලැස්ම අවබෝධකරගත් මරියතුමිය නිහතමානීව ප්‍රකාශ කලේ කුමක් ද?

(ii) ශුද්ධාත්මයෙන් පූර්ණව එලිසබෙත් තමා බැහැදැකීමට පැමිණි මරියතුමිය පිළිගෙන ප්‍රකාශ කළ වදන් කුමක් ද? එයින් අර්ථ ගැන්වෙන්නේ කුමක් ද?

(iii) දේව හඬට සවන්දීමෙන් කිතුනු දරුවෙක් ලෙස ප්‍රතිචාර දක්විය යුත්තේ කෙසේදැයි ශුද්ධ බයිබලයෙන් උදාහරණ ගෙනහැර දක්වමින් කරුණු 5ක් ඔස්සේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 2+3+5=10)

(03) (i) දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති දක්වීමට යොදාගත් උපමා කතා දෙකක් නම් කරන්න.

(ii) නැතිවූ බැටළුවා පිළිබඳ උපමාවෙන් ඉදිරිපත් කෙරෙන ධර්මතා තුනක් ලියන්න.

(iii) දේව රාජ්‍ය තුළ ඔබට පැවරෙන විශේෂ කාර්ය භාරය කරුණු පහක් තුළින් පැහැදිලි කරන්න.

(ල. 2+3+5=10)

(04) (i) දෙවියන්වහන්සේ දුන් බලාපොරොත්තු කෙරෙහි රැඳෙමින් වෙහෙස වී ක්‍රියාකළ පැරණි ගිවිසුමේ සඳහන් පුද්ගලයින් දෙදෙනෙක් නම් කරන්න.

(ii) ශුද්ධකමේ ජීවිතය තුළ දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න.

(iii) නොදුටු නමුත් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේම කරන ඔබ සදාකාල ජීවනය උරුමකර ගැනීමට කෙසේ ක්‍රියාකළ යුතු දැයි කරුණු පහක් තුළින් පැහැදිලි කරන්න. (ල. 2+3+5=10)

(05) (i) ස්වර්ගික වස්තු රැස්කිරීම පිළිබඳ ජේසුස්වහන්සේ ඉගැන්වූ උපමා කතා දෙකක් නම් කරන්න.

(ii) මෙම උපමා කතාවලින් ඔබගේ ජීවිතයට එකතුකරගත හැකි ආදර්ශ තුනක් ලියන්න.

(iii) ''දිළිඳුකම පිටු දකිමු. ජීවිත සුරකිමු'' මෙම වගකීම කිතුනු ඔබ ඉටුකරන ආකාරපහක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 2+3+5=10)

(06) (i) පනත් අනුව දස පනත වෙන් කළ හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(ii) ඊශ්‍රායෙල් ජන සමාජය දස පනතට අනුව තම ජීවිතය ගොඩනගාගනු ලැබීය. එසේ ඔවුන් තම ජීවිතය ගොඩනගා ගැනීමට අදාල කරගත් පනත් අතරින් පනත් තුනක් ලියන්න.

(iii) වත්මන් සමාජය ගුණවත් බවින් පිරිපුන් සමාජයක් බවට පත් කිරීමට ඊශ්‍රායෙල් ජන සමාජයෙන් ලබාගත හැකි යහපත් ආදර්ශ පහක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 2+3+5=10)

(07) පහත සඳහන් මාතෘකා අතරින් මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) මයිකල් ලැප්ස්ලි පියතුමා.

(ii) කන්ද උඩ දේශනයේ සඳහන් අත්තිවාරම් දෙක

(iii) කිතුණු බෞතිස්මය

(iv) කිතුණු අපගේ ආගන්තුක සත්කාරය (ල. 5+5=10)

**11 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය 2018** | **ක්‍රිස්තියානි ධර්මය**

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 1 ) | 03. ( 3 ) | 04. ( 2 ) | 05. ( 2 ) | 06. ( 2 ) | 07. (  ) | 08. ( 1 ) | 09. ( 1 ) | 10. ( 24 |
| 11. ( 3 ) | 12. ( 3 ) | 13. ( 4 ) | 14. ( 2 ) | 15. ( 2 ) | 16. ( 2 ) | 17. ( 1 ) | 18. ( 3 ) | 19. ( 2 ) | 20. ( 4 ) |
| 21. ( 3 ) | 22. ( 4 ) | 23. ( 1 ) | 24. ( 2 ) | 25. ( 4 ) | 26. ( 1 ) | 27. ( 2 ) | 28. ( 3 ) | 29. ( 4 ) | 30. ( 1 ) |
| 31. ( 3 ) | 32. ( 3 ) | 33. ( 2 ) | 34. ( 4 ) | 35. ( 2 ) | 36. ( 1 ) | 37. ( 2 ) | 38. ( 4 ) | 39. ( 3 ) | 40. ( 2 ) |

(ල. 40)

## II පත්‍රය

(01) (i) ජෝසෙප්, මරියතුමිය, එළිසබෙත් යන චරිතවලින් දෙකක් ලියා තිබිය යුතු ය.

(ii) මතෙව්, මාක්, ලූක්

(iii) පරිසිවරු හා විනයධරයෝ

(iv) අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමැත්තෙහු ද ඔබත් ඒ දේම ඔවුන්ට කරන්න.

(v) යෙසායා, මීකා

(vi) මීකා දිවැසිවරයා - මිදිවත්ත - ඊශ්‍රායෙල් ජනයාට

(vii) ඇහිල්ල හා කීකරුකම

(viii) ධර්මිෂ්ඨකම, ශුද්ධකම, උතුම් ප්‍රීතිය

(ix) මලකඩ කෑම, කාවෝ කා දැමීම.

(x) ගාබ්‍රියෙල් දේව දූතයා

ඔහු යනු - ස්නාවක ජෝහන්තුමා ය. (ල. 2 x 10 = 20)

(02) (i) ''බලන්න මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙස මට ඉටුවේවා.'' (ල. 02)

(ii) ''ඔබවනිතාවන් අතර ආශිර්වාද ලද්දී ය.''

''මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන්''

අපට දෙන ධර්මතාවයන් නම් අප එක් එක්කෙනා දේව සැලැස්ම ක්‍රියාත්මක කිරීමට විශේෂයෙන් අප නොසිතූ ලෙස තෝරා ගන්නා බව. (ල. 03)

(iii) දේව හඬට සවන්දෙමින් ඒවාට ප්‍රතිචාර දැක්වූ ශුද්ධ බයිබලයෙන් දක්වා ඇති ඕනෑම චරිතයක් ද එම චරිතයෙන් ගත් ආදර්ශ ද, කිතුණු දරුවෙක් ලෙස එම චරිතයෙන් ගත් ආදර්ශ අනුව කටයුතු කරන්නේ කෙසේදැයි ලියා තිබේ නම් ලකුණු දෙන්න. එක් උදාහරණයකට ලකුණු 1 බැගින් ලකුණු 5ක් දිය යුතු ය.

උදා:- ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ්, ජෝසෙප්, මෝසෙස්, දිවැසිවරු, නව ගිවිසුමේ, සෙකරියන්, එලිසබෙත්, ජෝසපේ, මරියතුමී, ගෝලයන්, (ල. 05)

(03) (i)
- මහා මංගල භෝජනය
- නැතිවූ බැටළුවා
- නැතිවූ පුත්‍රයා
- නැතිවූ කාසිය

(ල. 02)

(ii)
- බැටළුවන් 99 මෙන්ම නැතිවූ බැටළුවාද දේව රාජ්‍යයට ඉතා වැදගත් බව
- එබැවින් නැතිවූ එක බැටළුවා වුවද නැවත සොයාගෙන ගෙනවුත් රැළට එක්කරන බව
- නොමග යාමට බැටළුවන්ට ඉඩ නොදෙන බව
- දයානුකම්පාවෙන්, කාරුණික බවින් මනස්ථාපනයට යොමු කොට ඔවුන් පරිපූර්ණත්වයට පත්කොට දේව රාජ්‍යට එක් කරන බව. මෙහි බැටළුවාට මනුෂ්‍යයා ආදේශ කරමින් ලියා තිබුණත් ලකුණු ලබා දෙන්න. (ල. 03)

(iii)
- දේව රාජ්‍යය තුළ දෙවියන්වහන්සේගේ ප්‍රේමය අත්දැකීම.
- නැතිවූවන් වෙත දයානුකම්පාව දැක්වීම.
- මනස්ථාපනය තුළ නැවත දේව රාජ්‍යයට ගෙන ඒම.
- දේව රාජ්‍යයේ ගුණධර්ම සමාජගත කිරීම.
- අවශ්‍යතා ඇති අයට උපකාර කිරීම. ආදී ලෙස සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.

(ල. 05)

## II පත්‍රය - ඉතිරි කොටස

(04) (i) ආබ්‍රහම්, මෝසෙස් (ල. 02)

(ii) ධර්මිෂ්ඨකම, ශුද්ධකම, පරිපූර්ණ ප්‍රීතිය (ල.03)

(iii)
- ජීවමාන ක්‍රිස්තුස්වහන්සේ හා බද්ධවිය යුතු ය.
- ඇදහිල්ල තුළ දිවිගෙවිය යුතු ය.
- දෙවියන්වහන්සේ තුළ බලාපොරොත්තුවෙන් දිවි ගෙවිය යුතු ය.
- නැති නොවන ප්‍රීතිය ලබාගැනීමට කටයුතු කල යුතු ය.
- හැසිරීමෙන් ශුද්ධවන්ත විය යුතු ය.
- දේව ගරු බිය ඇතිව ජීවත් වීම. (ල. 05)

(05) (i) ධනවත් ප්‍රධානියා, ධනවතා හා ලාසරස් (ල. 02)

(ii) ඉහත උපමා කතා දෙකෙන්ම ලද හැකි ආදර්ශ ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ල. 03)

(iii)
- දිළිඳු අයට අපට හැකි ලෙස උපකාර කිරීම.
- අලසකම හැරදමා කටයුතු කිරීමට පියවර ගැනීම හා අන් අයට ද එසේ කිරීමට උදව් ලබා දීම.
- සම්පත් සාධාරණව බෙදී යාම කෙරේ සැලකිලිමත් විය යුතු ය.
- තමාට ඇති දේ නිසිලෙස පරිහරණය කිරීමට යොමු වීම.
- ධනාත්මක ජීවිත ආකල්ප ඇතිකර ගැනීමට සහය දීම.
- දිළිඳුකම අභියෝගයක් ලෙස භාර ගැනීම.
- ආත්මිකව ශක්තිමත් වීම. (ල. 05)

(06) (i)
- මිනිසා දෙවියන්වහන්සේ සම්බන්ධයෙන් කළ යුතු පරම යුතුකම හා වගකීම්
- මිනිසා හා මිනිසා අතර පැවතිය යුතු ගුණධර්ම හා මිනිස් සබඳතා (ල. 02)

(ii) දස පනතේ 5වන පනතේ සිට 10 වන පනත දක්වා ඇති පනත්වලින් 3ක් ලියා තිබිය යුතු ය. (ල. 03)

(iii) දස පනතේ ඇති පනත්, ඇදහිල්ල, විශ්වාසය, කීකරුකම ආදී ලක්ෂණ ඇත් කරමින් පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

(07) (i) මයිකල් ලැප්ස්ලි පියතුමා (11 ශ්‍රේණිය 105 පිටුව)

(ii) කන්ද උඩ දේශනයේ සඳහන් අත්තිවාරම් දෙක (10 ශ්‍රේණියේ 125 පිටුව)

(iii) කිතුණු බෞතිස්මයට අදාලව ලියා ඇති කරුණුවලට ලකුණු දෙන්න.

(iv) කිතුණු ආගන්තුක සත්කාරය (10 ශ්‍රේණියේ 125 පිටුව)